මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්

2026 මාර්තු

මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය **නොවෙනස් ව** තැබීමට මහ බැංකුව තීරණය කළා.

7.75%

එම තීරණයට බලපෑ හේතු?



- මැදපෙරදිග පවතින යුද්ධය වාතාවරණය මධ්‍යයේ ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑම.
- 2026 වසරේ පෙබරවාරි මාසයේ දී උද්ධමනය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් බලශක්ති මිල ගණන් ඉහළ යෑමේ බලපෑම්වලට මුහුණ දීමේ හැකියාවක් පැවතීම.
- 2025 වසරේ දී ආර්ථිකය 5%ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර, දිට්වා සුළි කුණාටුවෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම.
- 2026 වසරේ පෙබරවාරි අවසානය වන විට දළ නිල සංචිත එක්සත් ජනපද ඩොලර් බිලියන 7.3ක් දක්වා ඉහළ යෑම සහ එමගින් විදේශීය අංශය ශක්තිමත්ව පැවතීම.

අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?

- උද්ධමනය අපේක්ෂා කළ කාලයට පෙර, එනම් 2026 වසරේ දෙවන කාර්තුව වන විට 5%ක ඉලක්කයට ළඟා වී ඉන් අනතුරුව එහි ඉලක්කය වටා ස්ථායී වනු ඇතැයි පුරෝකථනය කෙරේ.
- මැදපෙරදිග යුද්ධය තත්ත්වය සමනය වුවහොත් ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව අබාණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.



දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සමීප ව නිරීක්ෂණය කරමින් සහ ආර්ථික වර්ධනයට සහාය වෙමින් උද්ධමනය 5%ක ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA